සියලු හිමිකම් ඇවිරිණි/ All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

**40 | S | I**

පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2018

First Term Test - Grade 11 - 2018

**විභාග අංකය ..................................** **පෙරදිග සංගීතය I** **කාලය පැය 01 යි**

- **අංක 1 -40 තෙක් ප්‍රශ්න වලට දී ඇති 1,2,3,4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.**
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.**

- **සියළු ම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

1 ස්වර සප්තකය තුළ ඇති චල හා අචල ස්වර සංඛ්‍යාව පිළිවෙලින්,
(i) 2 හා 5 කි. (ii) 7 හා 5 කි. (iii) 5 හා 2 කි. (iv) 5 හා 4 කි.

2. ගරිස, පමගරිස, නි රිස........ මෙම ස්වර අයත් රාගය,
(i) බිලාවල් (ii) භූපාලි (iii) යමන් (iv) කාෆි

3. ''සර්ගම් ගී'' පිළිබඳව ලියවී ඇති <u>වැරදි</u> ප්‍රකාශය කුමක් ද?
(I) රාග ගායනයට හා වාදනයට පෙර අභ්‍යාසයක් ලෙස යොදා ගත හැකි ගීත විශේෂයකි.
(ii) රාග ලක්ෂණ පමණක් ප්‍රකාශ කරනු ලබන පද මාලාවක් සහිත ගීත විශේෂයකි.
(iii) රාගයක ප්‍රධාන ස්වර සංගති ඇතුළත්, ස්වර වලින් සැදුම්ලත් තාලානුකූල ගීත විශේෂයකි.
(iv) අදාළ රාගයේ රාග රසය පමණක් ලබාදෙන ගායනයට හා වාදනයට සුදුසු ගීත විශේෂයකි.

4. විවාදී ස්වර යනු,
(i) වාදී ස්වරයට පමණක් දෙවන වන ස්වරයයි.
(ii) රාගයක කිසිසේත් නොයෙදෙන ස්වරයි.
(iii) රාග අලංකාරය සඳහා ඉඳහිට යොදා ගන්නා ස්වරයි.
(iv) රාගයක යෙදෙන ස්වර අතරින් ප්‍රධාන ස්වරයයි.

5. සර්ව කෝමළ රාගයකි,
(i) භූපාලි (ii) යමන් (iii) කාෆි (iv) භෛරවී

6. විකෘති ස්වර දෙකක් යෙදෙන නිර්දේශිත සම්පූර්ණ ජාති රාගයකි,
(i) කාෆි (ii) භූපාලි (iii) යමන් (iv) භෛරවී

7. පහත සඳහන් ඨේකාවේ දෙවන විභාගයට අයත් වන අවනද්ධාක්ෂර තෝරන්න.
/ති ති න / .......... / ධි න /
(i) ධි ධි න (ii) ධි න (iii) ති න (iv) න ති

8. රාගයක ජාතිය එහි ආරෝහණ හා අවරෝහණ ස්වර සංඛ්‍යාව මත තීරණය වේ. ඒ අනුව ආරෝහණයේ ස්වර 05ක් හා අවරෝහණයේ ස්වර 07 ක් යෙදෙන රාගයක ජාතිය වනුයේ,
(i) සම්පූර්ණ ඖඩව ජාති (ii) ඖඩව සම්පූර්ණ ජාති
(iii) ඖඩව ඖඩව ජාති (iv) ඖඩව ෂාඩව ජාති

9. බටහිර සංගීත ප්‍රස්තාරයක යෙදෙන Repitation Mark සනයට අයත් <u>නොවන</u> සංකේතය කුමක් ද?
(i) ·//. (ii) ·/. (iii) 𝄋. (iv) [ ]

10. රාග විස්තර ඇතුළත් කරමින් රචනා කර ඇති ගීත විශේෂය වන්නේ,
(i) ලක්ෂණ ගී ය. (ii) සර්ගම් ගී ය. (iii) මධ්‍යලය ගී ය. (iv) ස්වර ස්ථාපන ගී ය.

11. ''එන්ඩද මැණිකේ මමත් දියඹටා.......'' යන ග්‍රැමෆෝන් ගීතය ගයනුයේ,
(i) සූර්ය ශංකර් මොල්ලිගොඩ මහතා ය. (ii) සුනිල් ශාන්ත මහතා ය.
(iii) ආනන්ද සමරකෝන් මහතා ය. (iv) ඩබ්.ඩී. අමරදේව මහතා ය.

12. ''රවිකිඤ්ඤය'' නමින් ද හඳුන්වනු ලබන සංගීත භාණ්ඩය වන්නේ,
(I) තබ්ලාව යි. (ii) රබාන යි. (iii) ඩෝලය යි. (iv) වයලීනය යි.

13. 'බයිලා' නැමැති නැටුම් විශේෂය සමඟ යොදා ගත් සංගීතය හඳුන්වන නමකි,
(i) කැරොකේ සංගීතය. (ii) කපිරිඤ්ඤා සංගීතය. (iii) බටහිර සංගීතය. (iv) රොක් සංගීතය.

14. ''සොළොස්මත්'' පැදියකි,
(i) රූ රැසේ අඳිනා ලෙසේ අත් (ii) සඳවා සුදු වැලි පිවිතුරු
(iii) රැගත් සුරා පිරූ විතින් (iv) මන්මත් කරවන දන මුළු දෙරණා

15. ''සීත ගඟුලෙ දී ඇඳ පේ වෙනවා......'' මෙය,
(i) ඔළිඳ කෙළියේ ගීතයකි . (ii) තුන් සරණේ ගීතයකි .
(iii) නළඟන රැඟුම් ගීතයකි. (iv) මේවර කෙළියේ ගීතයකි.

16. ''මෙහෙ ගීත'' වර්ග දෙකක් වන්නේ,
(i) පාරු ගී, ගැල් ගී ය. (ii) පතල් ගී, රබන් ගී ය.
(iii) කෙළි ගී, ගොයම් ගී ය. (iv) දරු නැළවිලි ගී, පැල් ගී ය.

17. ඉයුජින් නාඩගමෙහි ඇතුළත් ''දූල් නිමල් සිසි සේ'' ගීත තනුව පාදක කර ගනිමින් නිර්මිත නව නාට්‍ය ගීත පාදය වන්නේ,
(i) ඉර සඳ දෙවියනි (ii) ලප නොමවන් සඳ
(iii) නන් සිරින් වොරදි (iv) උදුල කරවන

- **අංක 18 - 21 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට පහත වගුව උපයෝගී කර ගන්න.**

| A | B | C | D |
|---|---|---|---|
| ධි න | ධා ධි න | ත තිං S | ධා ධිං ධිං ධා |

18. දීප්චන්දි තාලයට අයත් විභාගය දැක්වෙන ඉංග්‍රීසි අක්ෂරය තෝරන්න.
(i) A (ii) B (iii) C (iv) D

19. සෑම විභාගයකට ම එක සමාන මාත්‍රා සංඛ්‍යාවක් යෙදෙන නිර්දේශිත තාල දෙකක් ඇතුළත් පිළිතුර වන්නේ,
(i) A හා B ය. (ii) A හා C ය. (iii) B හා C ය. (iv) B හා D ය.

20. තබ්ලාවේ දායාව හා බායාව එකවර වැයීමෙන් උපදින අවනද්ධාක්ෂර පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,
(i) A ය. (ii) B ය. (iii) C ය. (iv) D ය.

21. ''B '' අක්ෂරයට අදාළ හින්දුස්ථානි තාලයට බෙහෙවින් සමාන දේශීය බෙර පදය තෝරන්න.
(i) දොංජී / ජිගත (ii) දොං/ ජිංත / ගත / දොංත
(iii) දොංජිං / ජිංගත (iv) දොම් /කිට / කිට / දොම්

22. ''කර්ණාටක සංගීත ආභාසයෙන් සංගීතය නිර්මාණය වූ නාට්‍ය විශේෂය වන්නේ,
(i) නූර්ති නාට්‍ය ය. (ii) කෝලම් නාට්‍ය ය. (iii) ශෛලිගත නාට්‍ය ය. (iv) නාඩගම් නාට්‍ය ය.

- **අංක 23 - 26 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට පහත ගී පාද උපයෝගී කර ගන්න.**

අ - තෑර ඉස්ති තෑර
ආ - මෝරා බීජයෙනා
ඇ - කඳුළු හෙළා නෑඹිලියට
ඈ - ඇඳුරු තුමා වන්න මගේ
ඉ - දොඩම් කපාලා ඇඹුල් තනාලා

23. ''සේ ගී'' ගණයට අයත් ගී පාදය දැක්වෙන පිළිතුර වන්නේ,
(i) අ (ii) ආ (iii) ඇ (iv) ඈ

24. ජයන්ත අරවින්ද මහතා තනු රචනා කළ ගීය ඇතුළත් පිළිතුර වන්නේ,
(i) අ (ii) ඇ (iii) ඈ (iv) ඉ

25. වයලීන, බොංගෝ, ටැම්බරීන්, වැනි භාණ්ඩ උපයෝගී කර ගනිමින් සංගීත නිර්මාණය කළ සම්ප්‍රදායකට අයත් ගීයක් ඇතුළත් පිළිතුර වන්නේ,
(i) අ (ii) ඈ (iii) ඇ (iv) ඉ

26. මා පිය ගුණ වර්ණනා ඇතුළත් ගීතයකට අයත් අක්ෂරය.
(i) අ (ii) ආ (iii) ඇ (iv) ඈ

27. සබරගමුව හා උඩරට නර්තන සම්ප්‍රදායන්ට අයත් ප්‍රධාන අවනද්ධ භාණ්ඩ පිළිවෙලින්,
(i) දවුල හා යක් බෙරය යි. (ii) ගැට බෙරය හා දවුල යි.
(iii) පහත රට බෙරය හා ගැට බෙරය යි. (iv) දවුල හා ගැට බෙරයයි.

28. ''කැලිප්සෝ'' කණ්ඩායම් ගීතයක් වන්නේ මින් කුමක් ද?
(i) පිපී පිපී රේණු නටන (ii) මංගෝ කළු නැන්දේ
(iii) ගලන ගඟකි ජීවිතේ (iv) මුහුදු පතුල යට ඉඳලා

29. පරිගණක සංගීතයේදී විද්‍යුත් යතුරු පුවරු සංගීත භාණ්ඩයන් මගින් කරනු ලබන නිර්මාණයන් මේ නමින් හඳුන්වයි,
(i) E - Music (ii) Sound fonts (iii) Encarta (iv) E -Learning

30. ජන ගී ආශ්‍රිත සරළ ගීතයක් වන්නේ,
(i) අම්මා සඳකි (ii) දෑතට වළලු (iii) රත්න දීප (iv) ආල වෙලා පියසේ පටන්

31 ජප් තාලයට හා දීප්චන්දි තාලයට අනුරූපව අපරදිග සංගීතයේ Time Signature යොදනුයේ,
(i) $5_8$ හා $7_8$ ලෙසිනි (ii) $5_8$ හා $6_8$ ලෙසිනි (iii) $7_8$ හා $3_8$ ලෙසිනි (iv) $5_8$ හා $4_4$ ලෙසිනි

32. / ග - ම / ප - ග / ම - ග / රි - - / යන ස්වර ඛණ්ඩයට සුදුසු *Harmony part* ස්වර ඛණ්ඩය වන්නේ,
(i) /ස - ග / ප - ම / ධ - ස / ග - - / (ii) /ධ - ප / ග - ප / ධ - නි / ස් - - /
(iii) / ප - ධ / නි - ප / ධ - ප / ම - - / (iv) / නි - රි / ග - ම / ග - රි / ස - - /

33. 320Hz- 384Hz යන සංඛ්‍යාතයන් අයත් ස්වර වන්නේ,
(i) රි ම ස්වරයි (ii) ග ප යන ස්වරයි (iii) ග ම ස්වරයි (iv) ග - ධ ස්වරයි

34. කෙහෙර්වා තාලයේ ආවර්ත දෙකක මාත්‍රා සංඛ්‍යාව,
(i) ත්‍රිතාලයේ එක් ආවර්තයක මාත්‍රා ගණනට සමානවේ.
(ii) ජප් තාලයේ එක් ආවර්තයක මාත්‍රා ගණනට සමානවේ.
(iii) දාදරා තාලයේ ආවර්ත දෙකක මාත්‍රා ගණනට සමානවේ.
(iv) දීප්චන්දි තාලයේ එක් ආවර්තයක මාත්‍රා ගණනට සමානවේ.

35. ''අභිමාන්'' චිත්‍රපටයේ ''තෙරේ මේරේ.......'' යන ගීතය නිර්මාණය කර ඇත්තේ,
(i) භෛරවී රාගය ආශ්‍රිතව ය. (ii) යමන් රාගය ආශ්‍රිතව ය.
(iii) භූපාලි රාගය ආශ්‍රිතව ය. (iv) ඛමාජ් රාගය ආශ්‍රිතව ය.

36. ''චින්න චින ආසෙයි.......'' යන දමිළ ගීතයේ සංගීත අධ්‍යක්ෂවරයා වන්නේ,
(i) ක්‍රිෂ්ණ ගෝපාල් (ii) ඒ. ආර්. රහ්මාන් (iii) එස්. ඩී. බර්මන් (iv) පංකජ් උදාස්

37. ලයනල් රන්වල මහතා විසින් නිර්මාණය කරන ලද සරල ගීතයක් වන්නේ,
(i) වක්කඩ ළඟ දිය වැටෙන තාලයට (ii) දෑතට වළලු
(iii) මේ අවුරුදු කාලේ (iv) මල්සරා බැල්ම හෙලා

38. ''පාන්දරින්'' මෙම වචනයේ ඇති අක්ෂර වන්නේ,
(i) ප්ලුත 1 ලඝු 1 ගුරු 1 (ii) ලඝු 2 ප්ලුත 1 ගුරු 1
(iii) ප්ලුත 2 ලඝු 2 ගුරු 1 (iv) ලඝු 2 ගුරු 2 ප්ලුත 1

39. අන්තර් ජාලයේ ප්‍රචලිත විද්‍යුත් විශ්ව කෝෂ වෙබ් අඩවියක් වන්නේ,
(i) You Tube (ii) Midi File (iii) Wikipedia (iv) Cubase

40. නාද උත්පාදකයේ දිග ක්‍රමයෙන් අඩුවන විට එහි,
(i) ධ්වනි ගුණය වැඩි වේ. (ii) තාරතාවය අඩු වේ.
(iii) විපුලතාවය අඩු වේ. (iv) තාරතාවය වැඩි වේ.

සියලු හිමිකම් ඇවිරිණි/ All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

40 S II

පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2018
First Term Test - Grade 11 - 2018

විභාග අංකය .................................... පෙරදිග සංගීතය II කාලය පැය 02 යි

- **පළමු වන ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු ලියන්න.**

01. අංක i සිට iv දක්වා ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.

(i) නිධම / පගුරි/ සරිගු/ මප- / යන සර්ගම් ගී පාදය අයත් වන්නේ කුමන රාගයට ද ?
(ii) ධ - ග වාදී සංවාදී වන රාගය නම් කරන්න.
(iii) මධ්‍යමය පමණක් විකෘතිව යෙදෙන නිර්දේශිත රාගය කුමක් ද ?
(iv) ස ග ස රි ග , රි ම රි ග ම ....... යනුවෙන් යෙදෙන ස්වර අභ්‍යාසයේ ඊළඟ පියවර දෙක ලියන්න.

- අංක v සිට viii දක්වා ප්‍රශ්න වලට සුදුසු පිළිතුරු වරහන් තුළින් තෝරා ලියන්න.
(ඩබ්.බී. මකුලොලුව මහතා, ආචාර්ය ෂෙල්ටන් ප්‍රේමරත්න, හුණුවටය කතාව, දෙපානෝ)

| නාට්‍ය ගීතය | නාට්‍යයේ නම | සංගීත අධ්‍යක්ෂකවරයා |
|---|---|---|
| හෙළ ගැඹුරුයි පුත නොබලන් | v ........................................ | vi ........................................ |
| තව තව කට මැද දොඩවා | vii ........................................ | viii........................................ |

- අංක ix සිට xii දක්වා ප්‍රශ්න වල හිස්තැනට ගැලපෙන පිළිතුර ලියන්න.

(ix) ජප් තාලයේ එක් ආවර්තයකට අයිති මාත්‍රා සංඛ්‍යාව .................................... කි.
(x) භාරතීය ප්‍රසිද්ධ බටනලා වාදකයෙකි ....................................
(xi) "පැහැසරණිය මිණිපැමිණිය" පද්‍යය .................................... විරිත අනුව නිර්මාණය කර ඇත.
(xii) හඬෙහි උස් පහත් භාවය .................................... නොහොත් .................................... නමින් හඳුන්වයි.

02. පහත දැක්වෙන්නේ රාගධාරී තොරතුරු ඇතුළත් අසම්පූර්ණ වගුවකි.

| | රාගය | මේලය | ආරෝහණ | අවරෝහණ | වාදී සංවාදී | රාග ජාතිය | ගාන සමය |
|---|---|---|---|---|---|---|---|
| A | (i) ................ | කාෆි | (ii) ................ | සංනිධපමගුරිස | (iii) .............. | සම්පූර්ණ | (iv) ................ |
| B | (v) ................ | කල්‍යාණ | සරිගම්පධනිසං | (vi) ................ | (vii) .............. | (viii) ............. | රාත්‍රී ප්‍රථම යාමය |
| C | (ix) ................ | (x) ................ | සරිගුමපධුනිසං | (xi) ................ | (xii) .............. | සම්පූර්ණ | සර්ව කාලීන |

(i) ඉහත වගුව සම්පූර්ණ කිරීම සඳහා අදාළ පිළිතුරු ප්‍රශ්න අංකය හා රෝම ඉලක්කම යොදා ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න. **(ලකුණු 1/2 ×12 - 06)**

(ii) B හෝ C පේළි වලට අදාළ රාග දෙකෙන් එක් රාගයකට අයත් මධ්‍යලය ඛ්‍යාල ගීයක, ලක්ෂණ ගීයක, සර්ගමයක හෝ වාදිතයක ස්ථායි කොටස නියමිත තාල සංකේත සහිතව ප්‍රස්තාර කරන්න. **(ලකුණු 04)**

(iii) B පේළියේ සඳහන් මේලයට අයත් නිර්දේශිත වෙනත් රාගයක් නම් කර, එහි ආරෝහණ, අවරෝහණ, වාදී, සංවාදී ස්වර ලියා දක්වන්න. **(ලකුණු 02)**

03.

| ත | ධ | ධිං | තිං |
|---|---|---|---|

(i) ඉහත අවනද්ධාක්ෂර සියල්ල විවිධ අයුරින් යොදා ගනිමින් නිර්මාණය වන නිර්දේශිත තාල දෙකක් නම් කරන්න. **(ලකුණු 03)**

(ii) ඉන් ඔබ කැමති තාලයක් නියමිත තාල සංකේත සහිතව ප්‍රස්තාර කරන්න. **(ලකුණු 04)**

(iii) එම තාලයට අනුරූප වන දේශීය තිත් රූපය නම් කර ඊට අදාළ උඩරට බෙර පදය, නියමිත තිත් සංඥා සහිතව ප්‍රස්තාර කරන්න. **(ලකුණු 03)**

(iv) තබ්ලා වාදනයෙහි නිපුණ දේශීය තබ්ලා වාදකයින් දෙදෙනෙකු නම් කරන්න. **(ලකුණු 02)**

**04.** බොක්ස් ගිටාරයක රූප සටහනක් පහත දැක්වේ. එය ඇසුරු කර ගනිමින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.




(i) මෙහි වරහන් තුළ දී ඇති කොටස් නාම යොදා ගනිමින් රූප සටහනේ අංක A-H තෙක් කොටස් නම් කරන්න.

*(Fret board, Frets, Body, Sound hole, Tunning keys, Nut, Strings, Bridge)* **(ලකුණු 04)**

(ii) ගිටාරයේ තත් 06 සුසර කරන ස්වර පිළිවෙලින් ලියන්න. **(ලකුණු 06)**

(iii) සංගීතයේ දී භාවිතා කරනු ලබන වෙනත් විද්‍යුත් ගිටාර් වර්ග දෙකක් නම් කරන්න. **(ලකුණු 02)**

05. (I) සබරගමු වන්නම් පිළිබඳ කෙටි විස්තරයක් සපයන්න. **(ලකුණු 02)**

(ii) කෝකිල වන්නමේ, මුල් ගී පාද කොටස නියමිත තිත් රූපයට අනුව පද ප්‍රස්තාර කරන්න. **(ලකුණු 03)**

(iii) අනාසාතාත්මක ගීත වල දක්නට ඇති සුවිශේෂ ලක්ෂණ 04 ක් නම් කර ඔබ කැමති එක් අනාසාත්මක ගැමි ගීයක් ලියා දක්වන්න. **(ලකුණු 03)**

(iv) ගැමි ගී වල දැකිය හැකි සංගීතාත්මක ලක්ෂණ 04 ක් ලියන්න. **(ලකුණු 04)**

06

| | | | |
|---|---|---|---|
| + නි̣ ස - | ග - - ම | පධ නිසං රිං - | සං - - - |
| නි ධ ප - | ම ග ගම රිග | ස - නි̣ - | ස - - - |

(i) ඉහත දැක්වෙන ස්වර ප්‍රස්තාරය බටහිර සංගීත ක්‍රමයට අනුව ප්‍රස්තාර කරන්න. **(ලකුණු 04)**

(ii) ඉහත ස්වර ප්‍රස්තාරය 'පංචමය' ශ්‍රැති ස්වරය කර ගනිමින් පරිවර්තනය කර නැවත ලියන්න. **(ලකුණු 04)**

(iii) *Repitation mark, Sign to sign, Harmony* මින් 02 ක් පිළිබඳව උදාහරණ සහිතව විස්තර කරන්න.

**(ලකුණු 04)**

07. (i) පහත සඳහන් මාතෘකා අතරින් 03 ක් උදාහරණ සහිතව විස්තර කරන්න.

a. යතිය b. මුල් යුගයේ ගුවන් විදුලි සරළ ගී

c. ධ්වනි ගුණය d. විෂම ග්‍රහ **(ලකුණු 09)**

(ii) පන්ති කාමරයේ දී ඔබ ගායනා කළ මා පිය ගුණ ඇතුළත් ගීතයක ස්ථායි කොටසේ ගී පද ලියා දක්වන්න.

**(ලකුණු 02)**

**පළමු වාර පරීක්ෂණය - 2018**
**පෙරදිග සංගීතය - 11 ශ්‍රේණිය**
**පිළිතුරු පත්‍රය**
**I කොටස**

| | | | |
|---|---|---|---|
| 1 - iii | 11 - iii | 21 - i | 31 - i |
| 2 - iii | 12 - iv | 22 - iv | 32 - iii |
| 3 - ii | 13 - ii | 23 - ii | 33 - ii |
| 4 - iii | 14 - iv | 24 - iii | 34 - i |
| 5 - iv | 15 - ii | 25 - i | 35 - iv |
| 6 - i | 16 - i | 26 - iii | 36 - ii |
| 7 - ii | 17 - iii | 27 - iv | 37 - iii |
| 8 - ii | 18 - iii | 28 - ii | 38 - i |
| 9 - iii | 19 - iv | 29 - i | 39 - iii |
| 10 - i | 20 - iv | 30 - ii | 40 - iv |

**II කොටස**

01. (I) කාෆි රාගය (ii) බිලාවල් රාගය (iii) යමන් රාගය
(iv) ගපගමප, මධමපධ (v) හුණුවටය කථාව (vi) ආචාර්ය ෂෙල්ටන් ප්‍රේමරත්න
(vii) දෙපානෝ නාට්‍යය (viii) ඩබ්. බී. මකුලොළුව මහතා (ix) මාත්‍රා 10
(x) හරි ප්‍රසාද් චෞරසියා (xi) සමුද්‍රඝෝෂ (xii) තාරතාවය/ උච්ච නීච භේදය

**මුළු ලකුණු 12**

02. (i) (I) කාෆි (ii) ස රි ගු ම ප ධ නි ස් (iii) ප/ස
(iv) රාත්‍රී දෙවන ප්‍රහරය (v) යමන් රාගය
(vi) ස් නි ධ ප ම ග රි ස (vii) ග / නි
(viii) සම්පූර්ණ (ix) භෛරවී (x) භෛරවී
(xi) ස් නි ධ ප ම ගු රි ස (xii) ම /ෂ **(ලකුණු 1/2 x 12 = 6)**

(ii) නියමිත ස්වර සංඥා හා තාල සංකේත සහිතව ලියා ඇත්නම්, **(ලකුණු 04)**

(iii) භූපාලි රාගයේ රාග විස්තර නිවැරදිව ලියා ඇත්නම්, **(ලකුණු 02)**

03. (I) ත්‍රිතාලය හා දීප්චන්දි තාලය **(ලකුණු 03)**

(ii) නිවැරදිව ප්‍රස්තාර කිරීම **(ලකුණු 04)**

(iii) නියමිත තිත් සංඥා සහිතව ප්‍රස්තාර කිරීම **(ලකුණු 03)**

(vi) විජේරත්න රණතුංග මහතා, චානක පීරිස් මහතා, පේෂල මනෝජ් මහතා, මනෝජ් පීරිස් මහතා වැනි දෙදෙනෙකු නම් කර ඇත්නම් **(ලකුණු 02)**

04. (i) A - Tunning Keys E - Sound hole
B - Nut F - Body
C - Finger board G - Bridge
D - Frets H - Strings **(ලකුණු 04)**

(ii) E A D G B E / 1 2 3 4 5 6 ග̣ ධ̣ රි ප නි ගං හෝ $E^6 A^5 D^4 G^3 B^2 E^1$ **(ලකුණු 06)**

(iii) රිදම්/ ලීඩ් / බේස් ගිටාර් **(ලකුණු 02)**

05. (i) කෙටි විස්තරයට **(ලකුණු 02)**

(ii) තිත් රූප අනුව නිවැරදි ප්‍රස්තාරයට **(ලකුණු 03)**

(iii) ලක්ෂණ නිවැරදිව ලියා ඇති විට ල- 02 ගීතය ලිවීමට ලකුණු 01 **(ලකුණු 03)**

(iv) නාද මාලා සරලය, ස්වර පරාසය පටුය, බොහෝ විට ඉහළ ශ්‍රැතියෙන් ගයයි, බොහෝ විට එකම තනුව අනුව පද හතරම ගයයි.
තාල සහිතව හා තාල රහිතව නිදහස්ව ඇද පැද ලෙලවා ගයන තනු දක්නට ඇත.
වැනි වෙනත් ඕනෑම සංගීත ලක්ෂණ 04 කට **(ලකුණු 04)**

06. (i) 

(ලකුණු 04)

(ii) උදාහරණ සහිතව විස්තර කර ඇත්නම් (ලකුණු 04)

(iii) නිවැරදි පිළිතුරට ලකුණු ලබා දෙන්න (ලකුණු 04)

07. (i) උදාහරණ සහිතව විස්තර කර ඇත්නම් (ලකුණු 09)

(ii) ගීතයේ ස්ථායි කොටස නිවැරදිව ලියා ඇති විට (ලකුණු 02)

(iii) ගායකයා /ගායිකාව නම් කිරීම (ලකුණු 01)